ඒ භාග්‍යවත් අරහත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ ට නමස්කාර වේවා!

# බුදුන් වදාල ධර්මය

## *ති ලකුණු නැණැ'ස තිලොව ට දුන් තිලකාණන්...............*

| | | | |
|---|---|---|---|
| 01 | අදහම් | ගොසින් මනු ගුණ දම් දන් | අතුරු |
| | නොදහම් | කලෙක වී උනුනු'න් පර | සතුරු |
| | සදහම් | අමා යුතු මෙත සත වෙත | පැතුරු |
| | අදහම් | මහා කරුණා මුණි රජ | උතුරු |
| 02 | කල සුණු | අවිදු ගණ'දුරු පුන් | දිණිඳාණන් |
| | හර සුණු | සසර තතු පෑ ගුණ | මුහුදාණන් |
| | ති ලකුණු | නැණැ'ස තිලොවට දුන් | තිලකාණන් |
| | පැද කුණු | කොටත් කප, නැත නිම් | නිදුකාණන් |
| 03 | තිලොවට | සුබාසිත යමකට | නිදානෝ |
| | කර වට | ගිලුණු බව දුක් රෝ | වෙදානෝ |
| | නිවනට | කෙලෙස් අම නිවණ ට | මඟානෝ |
| | නම කොට | බැතින් පුදනෙමි දම් | රජානෝ |
| 04 | හිස පිට | තිබු බරක් පසෙකට | දමා මී |
| | විලසට | දුරැර බිය සිසිලෙන් | තෙමා මී |
| | සතුනට | පෙවූ සිරි සදහම් | අමා මී |
| | දෙලොවට | වැඩැ'ති මුණි සිරිපා | නමා මී |
| 05 | ඔද තෙද | බෙලෙන් රුපු යුද බිඳී | අනුත්තර |
| | හද බැඳ | තබන බඹසර වෙත | පවිත්තර |
| | විඳ විඳ | සිටිය බැඳී සසර ම | සවිස්තර |
| | අද අද | නසව! පවසයි මුණි | අනුත්තර |
| 06 | ඇඳූ | සසර දැළ හරණට මඟ | පැදූ |
| | පැදූ | අම නිවණ සත හට සෙත | සැදූ |
| | සැදූ | දන ට දෙලොව ම වැඩ ගුණ | සාදූ |
| | සාදූ | බැතින් වඳිනෙමි සම්බුදු | සාදූ |


BudunWadalaDharmaya1@gmail.com

සාදු! සාදු!! සාදු!!!